**ශීර්ෂය 303 - පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 303 - පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජනවාරි 24 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 103.50 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 86.53 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 16.97 ක් හෙවත් සියයට 16.40 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 72.00 | 68.25 | 3.75 | 5.21 |
| මූලධන | 31.50 | 18.28 | 13.22 | 41.97 |
| **එකතුව** | **103.50** | **86.53** | **16.97** | **16.40** |

(ආ) **වෙනත් අමාත්‍යාශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් රු.මිලියන 11.00 ක ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 10.78 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 0.22 ක හෙවත් සියයට 2.00 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 30301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 3.65 | 3.73 | 2.80 | 3.46 | 25.00 | 11.79 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 02 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 7.76 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0015/0158/000 | 7.66 |
| 6000/0000/00/0013/0132/000 | 0.10 |
| **එකතුව** | **7.76** |

## 2.4 විගණන නිරීක්ෂණය

පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (i) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය. | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

### 3.2 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 571(1) ප්‍රකාරව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ඉකුත් වූ තැන්පතු පිළිබඳව ලැයිස්තු පිළියෙල කර නොතිබුණු අතර එකතුව රු.119,480 ක් වූ ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 ජුනි 24 දිනැති හා අංක 243/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 5.3 හා 5.4 ඡේදයන්හි විවිධ තැන්පතු ගිණුම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය දක්වා තිබුණත්, දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 30301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.110,220 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 08 ක සිට වර්ෂ 12 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත් එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

### 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

#### 3.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති හා අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා තුන් අවුරුදු මධ්‍යකාලීන අයවැය රාමුව තුළ නියමිත මුදල් වර්ෂයට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම තුළ චක්‍රලේඛයේ 3 ඡේදයේ සඳහන් සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩල සහ තථ්‍ය කාර්ය මණ්ඩල විස්තර හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

**3.5.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ), (ඇ), (ඉ) හා 4.2.2 (අ) මාර්ගෝපදේශ ප්‍රකාරව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතුව තිබුණි. එකී සැලැස්ම මාස 06 කට නොවැඩි කාලයක් තුළ යාවත්කාලීන කළ යුතු බව හා ප්‍රසම්පාදන කාලසටහන් පිළියෙල කළ යුතුව තිබුණත්, ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.

**3.5.3 අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**3.5.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2015 වර්ෂයට අදාළ එම වාර්තාව 2016 අගෝස්තු 24 දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) පසුගිය වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද කහවත්තේ පිහිටි හිරමඩගම හා නුවරඑළියේ පිහිටි ශාන්තිපුර යන පේෂකර්මාන්ත පුහුණු පාසල් අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

(ii) දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් 2013 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවැති අතර, තවත් වාහනයක් ඌන උපයෝජිතව පැවතුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 කට අඩු කාලයක සිට පැවැත එන බේරුම් නොකළ බැරකම් රු. 432,887 ක් විය.

**3.7 අනුකූල නොවීම**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 1646 | දෙපාර්තමේන්තුව සතු සංචිත වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා එළඹෙන මාසයේ 15 දිනට පෙර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | |
| 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන චක්‍රලේඛයේ 3.4 ඡේදය | 2004 ජනවාරි 01 දිනෙන් පසුව මිලදී ගත් වත්කම් සම්බන්ධයෙන් විස්තර ඇතුළත් වාර්තාවක් අර්ධ වාර්ෂිකව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 3.8 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

දෙපාර්තමේන්තුවේ අරමුණුවලට පරිබාහිර කාර්යයක් සඳහා පුවත්පත් දැන්වීමක් පළ කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.252,000 ක් වැය කර තිබුණි. මේ සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය මත ගෙවීම සිදු කළ බව අධ්‍යක්ෂවරයා විසින් විගණනයට දන්වා තිබුණි.

### (ආ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය පිළිබඳ අංග සම්පූර්ණ දැනුමක්, පුහුණුවක් ලබාදීමට හා කර්මාන්තයට අවශ්‍ය කළමනාකරුවන්, උපදේශකවරුන් සහ ව්‍යවසායකයින් බිහිකිරීම අරමුණු කර ගෙන දිවයිනේ විවිධ ප්‍රදේශවල පේෂ කර්මාන්ත පුහුණු පාසල් පිහිටුවා වාර්ෂිකව සිසුන්ට නොමිලේ පුහුණුව ලබා දී තිබුණි. ක්‍රියාකාරී සැලැස්මට අනුව 2014 ජුලි 01 දින සිට 2015 ජුලි 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළ එක් අවුරුදු පේෂ කර්මාන්ත පුහුණු පාඨමාලාව සඳහා සිසුන් 200 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම් කර තිබුණි. ඒ සඳහා සිසුන් 180 ක් පමණක් බඳවා ගෙන තිබුණි. පාඨමාලාව සම්පූර්ණ කරන ලද සිසුන් සංඛ්‍යාව 152 ක් හෙවත් බඳවා ගත් සිසුන් ප්‍රමාණයෙන් සියයට 84 ක් වී තිබුණි.

(ii) දේශීය අනන්‍යතාවය සහ සංස්කෘතියට උචිත පරිදි මෙන්ම දේශීය හා විදේශීය වෙළඳපොල ක්‍රියාකාරීත්වය ජයගත හැකි පරිදි අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයෙහි නිර්මාණශීලි සහ තරඟකාරී රෙදිපිළි නිෂ්පාදනය සඳහා නිෂ්පාදකයින් යොමු කිරීමේ අරමුණින් මෝස්තර නිර්මාණකරුවන් පුහුණු කිරීම සඳහා නේවාසික එක් අවුරුදු මෝස්තර පුහුණු පාඨමාලාවක්, ගැටඹේ හා කටුබැද්ද මෝස්තර පුහුණු පාසල් මඟින් පවත්වා තිබුණි. 2015 ජනවාරි 12 සිට 2016 ජනවාරි 11 දක්වා වූ අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 100 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම් කර තිබුණද බඳවා ගත් සිසුන් ප්‍රමාණය 22 දෙනෙකු පමණක් වූ අතර ඉන් සිසුන් 14 දෙනෙකු පමණක් පාඨමාලාව සම්පූර්ණ කර තිබුණි. එය බඳවා ගත් සිසුන් ප්‍රමාණයෙන් සියයට 64 ක් වී තිබුණි.

(iii) පේෂ කර්මාන්ත පුහුණු පාසල්වලට 2014/2015 හා 2015/2016 අධ්‍යයන වර්ෂ සඳහා සිසුහු 341 ක් ද, මෝස්තර පුහුණු පාසල්වලට 2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා සිසුහු 22 ක්ද බඳවා ගෙන තිබුණි. නමුත් ඉහත සිසුන් සඳහා එක් පෞරුෂත්ව සංවර්ධන වැඩසටහනක් පමණක් පවත්වා තිබුණු අතර ඒ සඳහා සිසුහු 28 දෙනෙකු පමණක් සහභාගි කරගෙන තිබුණි.

(iv) පේෂකාර්මික ව්‍යවසායකයින්ගේ අලෙවි ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රු.5,315,772 ක් වැය කර ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි ප්‍රදර්ශනයක් පවත්වා තිබුණි. එයින් ව්‍යවසායකයින් 80 කට අලෙවි පහසුකම් ලබාදීමට සැලසුම් කර තිබුණද, ව්‍යවසායකයින් 46 දෙනක් සඳහා පමණක් අලෙවි පහසුකම් සපයා තිබුණි.

(v) කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ප්‍රවර්ධනය සඳහා රු.2,095,400 ක් වැය කර තෙදිනක් පුරා පැවති අලෙවි සල්පිලේදී අලෙවි පහසුකම් ව්‍යවසායකයින් 25 දෙනෙකුට පමණක් සපයා දි තිබුණි.

**(ඇ) සැලැසුම් කිරීම**

ක්‍රියාකාරි සැලැස්ම අනුව සැලැසුම් කර තිබූ පහත සඳහන් වැඩසටහන් වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) ඵලදායිතාවය ප්‍රවර්ධනය සඳහා සේවාස්ථ පුහුණුව යටතේ දෙපාර්තමේන්තුවේ නිලධාරින් සඳහා නිපුණතා සංවර්ධන වැඩමුළු පැවැත්වීමට සැලැසුම් කර තිබුණද එම වැඩමුළු පවත්වා නොතිබුණි.

(ii) පේෂ පාසල් සඳහා සිසුන් බඳවා ගැනිම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, ප්‍රවර්ධන ක්‍රියාකාරකම් යටතේ සිදු කිරීමට සැලැසුම් කර තිබුණු පේෂ ප්‍රතිව්‍යුහගත කිරීමේ ව්‍යාපෘතිය වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්**

මුදල් රෙගුලාසි 395(ඇ) ප්‍රකාරව එක් එක් මාසය අවසානයේ දී ඇති ගනුදෙනුවල තත්ත්වය සම්බන්ධයෙන් එළඹෙන මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ

යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරිමට දින 11 ක සිට දින 150 ක් දක්වා වු දිර්ඝ කාල පරාසයක් ප්‍රමාද කර තිබුණි.

**(ආ) කල් ඉකුත් වූ චෙක්පත්**

2015 දෙසැම්බර් 31 දිනට මාස 06 ක් ඉක්මවූ නිකුත් කළ නමුත් ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් නොවූ රු.118,071 ක චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.10 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරික්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැර වීම.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම හා බිම කාපට් කර කාමර වෙන්කිරීම.**

දෙපාර්තමේන්තුව කුලී පදනම මත ලබාගෙන තිබූ විශ්‍රාම වැටුප් දෙපර්තමේන්තුවේ 3 වන මහලෙහි අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.3,272,350 ක් ගෙවා තිබූ අතර ඒ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2(අ),(ආ) හා 4.2.3 මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදනය ආරම්භයේ සිට අවසානය දක්වා පියවර දක්වමින් කාලසටහනක් සකස් කර නොතිබුණි.
- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2(ඈ) මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ පිරිවිතර ඇතුළු ලංසු ලේඛන කෙටුම්පත් කිරීම, සමාලෝචනය සහ අනුමත කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර සමහර ඉදිකිරීම් ක්‍රමවත්ව සැලැසුම් කර තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණි.
- මෙකී කොන්ත්‍රාත්තුවට අදාළ වන ලෙස සිවිලිම ගැසීම, වැසිකිළි පද්ධතිය අළුතින් සකස් කිරීම හා කුඩා කාමර වෙන් කිරීම පිළිබඳව ක්‍රමවත්ව සැලසුම් සකස් කර තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කර නොතිබූ අතර වරින් වර එම කාර්යයන් වෙනස් කිරීම්වලට ලක්කර ද තිබුණි.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.3 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසුකරුවන් වෙත ඉදිරිපත් කර තිබුණු උපදෙස්වල සියළු තොරතුරු අන්තර්ගත විය යුතු වුවත්, ඊට පටහැනිව ලංසු විවෘත කිරිමෙන් පසු ලංසුකරුවන්ගේ පලපුරුද්ද විමසා තිබුණි. මේ අනුව ගොඩනැගිලි අළුත්වැඩියා කිරිමේ කොන්ත්‍රාත්තුව සඳහා අවම ලංසුව ඉදිරිපත් කළ ආයතනයේ පූර්ව වැඩ පිළිබඳව තොරතුරු නැති බව ප්‍රකාශ කර ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි. මේ නිසා පළමු අවම මිලට වඩා රු.146,300 ක්වූ දෙවන අවම මිල සඳහන් ලංසුව ඉදිරිපත් කරනු ලැබූ ආයතනය වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

- බිම කාපට් අතුරා කාමර වෙන්කිරීම සම්බන්ධ කොන්ත්‍රාත්තුව සඳහා කොලොන්නාව රජයේ කර්මාන්ත ශාලාව විසින් රු.1,289,800 ක ලංසුවක් ඉදිරිපත් කර තිබුණි. එය ඇගයීමට ලක් කළ බව තාක්ෂණික ඇගයීම් කමිටු වර්තාවෙන් අනාවරණය වී නොතිබුණි.

**(ii) අත්යන්ත්‍ර හා වයින්ඩිං යන්ත්‍ර මිලදී ගැනීම.**

---------------------------------------------

මාතලේ අත්යන්ත්‍ර ව්‍යාපෘතිය හා දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් සඳහා 60" අත්යන්ත්‍ර 245 ක් හා වයිංඩින් යන්ත්‍ර 225 ක් මිලදී ගැනීම සඳහා 2015 වර්ෂයේදී රු.14,324,687 ක් ගෙවා තිබුණි. මේ පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2014 ජුනි 20 දින ආරම්භ කළ මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අවසාන යන්ත්‍ර තොගය මාස 20 ක ප්‍රමාදයකින් පසුව 2016 මාර්තු 24 දින සපයා තිබුණි.

- 60" අත්යන්ත්‍ර 245 ක් හා වයින්ඩිං යන්ත්‍ර 225 ක් මිලදී ගැනීම සඳහා 2014 නොවැම්බර් 19 දින අත්සන් කර තිබූ ගිවිසුමට අනුව 2014 දෙසැම්බර් 31 දිනට පෙර භාණ්ඩ සැපයිය යුතු වුවත්, යන්ත්‍ර සැපයීමට 2015 අගෝස්තු 25 දින සිට 2016 මාර්තු 24 දින දක්වා වූ කාලවකවානුවක් ගත කර තිබුණි.

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව භාණ්ඩ සඳහා ඇස්තමේන්තු කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 10 කට අඩු නොවන කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගත යුතු වුවත්, සියයට 5 ක කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන තිබුණි.

- මෙම යන්ත්‍රවලින් මාතලේ අත්යන්ත්‍ර ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදී ගත් අත්යන්ත්‍ර 175ක ප්‍රමාණයෙන් 50 ක් හා වයින්ඩිං යන්ත්‍ර 150 ක ප්‍රමාණයෙන් 50 ක් පමණක් බෙදා හැර තිබුණු අතර එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරිම නිසා ඉතිරි යන්ත්‍ර බෙදා දීමට නොහැකි වී තිබුණි.

- මිලදී ගත් අත්යන්ත්‍ර 245 කින් හා වයින්ඩිං යන්ත්‍ර 225 කින් 2016 ජුනි 28 දින වන විට අත්යන්ත්‍ර 130 ක් හා වයින්ඩිං යන්ත්‍ර 136 ක් ගබඩාවේ ඉතිරිවී තිබුණි.

-

**(iii.) තලාව පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනැගිලි 02 අළුත්වැඩියා කිරීම.**

------------------------------------------------------------------

තලාව පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනැගිලි 02 අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.1,728,425 ක් වර්ෂයේදී ගෙවා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව පිරිවිතර ඇතුළු ලංසු ලේඛන කෙටුම්පත් සකස් කිරීම, ඒවා සමාලෝචනය කිරීම හා අනුමත කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම ප්‍රසම්පාදන අස්ථිත්වයේ වගකීම බව දක්වා තිබුණත්, ඉහත මිලදී

ගැනීම සඳහා 2015 අගෝස්තු 07 දින ලංසු විවෘත කර තිබුණු අතර ඊට පසු 2015සැප්තැම්බර් 02 දින තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර තිබුණි.

- මෙම අළුත්වැඩියාව සම්බන්ධයෙන් තාක්ෂණ ඇගයීම් කමිටුවේ වාර්තාව 2015 ඔක්තෝබර් 06 දින ලබා දී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.4.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු ඇගයීම හැකිතාක් ඉක්මණින් සිදු කළ යුතු වුවත්, තාක්ෂණ ඇගැයීම් වාර්තාව ලංසු විවෘත කළ දින සිට මාස 02 ක කාල පමාවකින් පසුව ඉදිරිපත් කර තිබුණි.

- අදාළ කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා තෝරාගෙන තිබූ ඉදිකිරීම් ආයතනය, ICTAD ආයතනයේ 2010 වර්ෂයේ දී ලියාපදිංචි වී තිබුණි. නමුත් එකී ආයතනයේ පෙර වැඩ පිළිබඳ විස්තර සඳහන් කර නොතිබුණි. තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාවේ මෙම කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමට පිළිබඳව සාධාරණ හේතු නිශ්චිතව දක්වා නොතිබුණි.

## 3.11 අනාර්ථික ගනුදෙනු

---------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) වටපුළුව පේෂ පාසලේ සිදුවී තිබුණු අභ්‍යන්තර ජල කාන්දුව අනාවරණය කර ගෙන එය නැවැත්වීමට කටයුතු නොකිරිම නිසා අපතේ ගිය ජලය වෙනුවෙන් රු.124,179 ක ජල බිල්පත් සඳහා ගෙවා තිබුණි.

(ආ) 1992 සිදුවු සොරකමක් සම්බන්ධයෙන් ආරක්ෂක ආයතනය වගකිව යුතු බව සඳහන් කරමින් 1992 නොවැම්බර් මාසයේ සිට එම ආයතනයට සිදු කළ ගෙවීම් නතර කර තිබුණි. එම තීරණයට එරෙහිව ආරක්ෂක ආයතනය විසින් පවරා තිබුණු නඩුවේ තීන්දුව අනුව රු.823,570 ක් වූ නෛතික පොලියක් සමඟ රු.1,476,770ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

## 3.12 කළමනාකරණ දූර්වලතා

------------------------

නියැදි විගණන පරීක්ෂාවලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව සතුව තිබූ බලවේග පේෂ කර්මාන්ත ව්‍යාපාර පෞද්ගලික අංශයට දිගුකාලීන බදු පදනම මත ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1995 ජුලි 21 දිනැති අංක එස්ඊඅයි/ඊ/4/34 දරන ජනාධිපති ලේකම් කාර්යාලයෙ විසින් රජයේ ඉඩම් පැවරීම පිළිබඳ මාර්ගෝපදේශ මැයෙන් නිකුත් කළ චක්‍රලේඛයේ සඳහන් පහත විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

- චක්‍රලේඛයේ 8(අ) ඡේදයේ ප්‍රකාරව ප්‍රතිශෝධිත මුදල කලින් නියම කරන ලද ගණනින් සියයට 150 කට අඩු නොවන පරිදි අවුරුදු 5කට වරක් බදු කුලිය කලින් කලට ප්‍රතිශෝධනය කර නොතිබුණි.

- චක්‍රලේඛයේ 8(ඇ) ඡේදය ප්‍රකාරව බදු කුලී ගෙවීම පැහැර හැරීම නිසා බදු ගිවිසුම ඉබේම අහෝසි වන බව දක්වා තිබුණද, යටිනුවර, තලාතු ඔය හා උඩු නුවර පෙහෙකම්හල් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

- 9 වන ඡේදය ප්‍රකාරව බදු දීමනාකරු විසින් බදු ගිවිසුම නිතිපතා අළුත් කළයුතු අතර, හිඟ මුදල් එකතුවීමට ඉඩ නොතබා බදු කුලී එකතු කිරීම කළ යුතුව තිබුණි. නමුත් හිඟුරක්ගොඩ, බිබිල, යටිනුවර, තලාතු ඔය හා උඩු නුවර පෙහෙකම්හල් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) බණ්ඩාරවෙල බලවේග ජේෂ කර්මාන්ත ව්‍යාපාරයට අයත් බිබිල හා පස්සර පෙහෙකම්හල් විකිණීමට අදාළව එහි අමතර කොටස් වෙනුවෙන් වූ මුදල් අයකර ගැනීමට නඩුවක් පවරා තිබුණි. එම නඩුවේ තීන්දුව 2001 ජූනි 23 දින ලබා දී තිබුණි. එම තීන්දුව අනුව පොලිය වශයෙන් අයවිය යුතු රු.845,268 ක් එදින සිට වර්ෂ 03 ක කාලයක් තුළදී අය කරගත යුතු වුවද, එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි

(iii) බිබිල නිම්හම් ආයතනය 1996 ජනවාරි 01 දින සිට රු.150,000 ක වාර්ෂික බදු මුදලකට බදුදී තිබුණි. එහි ව්‍යාපාර කටයුතු සිදු නොකිරීම නිසා 2011 අගෝස්තු 04 දින ඉඩම හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ භාරයට ගෙන තිබුණු අතර එදිනම ප්‍රාදේශීය ලේකම් වෙත එම දේපල භාරදී තිබුණි. බදුකරුගෙන් අයවිය යුතු රු.1,681,250 ක බදු මුදල අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(iv) 1993 ජනවාරි 31 දින රු.108,000 ක වාර්ෂික බද්දකට යටත්ව හිඟුරක්ගොඩ බලවේග පෙහෙකම්හල පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල බදු දී තිබුණි. බදුකරු විසින් බදු ගෙවීම් පැහැර හැරීම නිසා 2001 පෙබරවාරි 12 දින ප්‍රාදේශීය ලේකම් වෙත භාර දී තිබුණි. අදාළ බදුකරුගෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතුව තිබුණු රු.529,600 ක හිඟ බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(v) කුරුවිට බලවේග පෙහෙකම්හලේ ගැණුම්කරුගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීම සහා කඩුවක් පවරා තිබුණි. එම නඩුවේ තීන්දුවට අනුව අමතර කොටස් සඳහා හා දණ්ඩන පොලිය ලෙස රු.1,355,079 ක් අය කළ යුතුව තිබුණි. ඉන් රු.225,846 ක් තවදුරටත් අයවිය යුතුව තිබුණත්, එම මුදල අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

(vi) යටිනුවර බලවේග පෙහෙකම්හල 1995 ජූලි 14 දින තිස් අවුරුදු බදු පදනම යටතේ රු.212,000 ක වාර්ෂික බදු මුදලකට බදු දී තිබුණි. මෙම ඉඩමේ කොටසක අනවසර පදිංචිකාරියක් පදිංචි වී සිටින බැවින් එම ගැටළුව නිරවුල් කර ඉඩමේ නිදහස්ව හා සාමකාමීව භුක්තිය බදුකරු වෙත භාරදීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන නොතිබුණි. මේ නිසා බදු දුන් දින සිට 2012 වර්ෂය දක්වා අය විය යුතුව පැවති රු.2,756,000 ක බදු මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. එම හිඟ බදු මුදල් නොමැතිව 2013 වර්ෂයේ සිට වර්ෂයකට රු.212,000 බැගින් වූ බදු මුදල් ගෙවා තිබුණි.

(vii) තලාතු ඔය බලවේග පෙහෙකම්හල 2000 දෙසැම්බර් 01 දින රු.148,000ක වාර්ෂික බදු මුදලකට තිස් අවුරුදු බදු පදනම මත බදු දී තිබුණි. බදුකරු විසින් ව්‍යාපාර කටයුතු සිදුකළ 2000 වර්ෂයේ සිට 2004 වර්ෂය දක්වා හා 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය

දක්වා වූ වර්ෂ 08 ක කාලය සඳහා පමණක් රු.1,184,000 ක් ගෙවා තිබුණු අතර ඉතිරි රු.1,036,000 ක බදු මුදල් අයකර ගෙන නොතිබුණි.

(viii) උඩුනුවර බලවේග පෙහෙකම්හල 2000 පෙබරවාරි 01 දින රු.216,000 ක වාර්ෂික බදු මුදලකට තිස් අවුරුදු බදු පදනම මත බදු දී තිබුණි. බදුකරු විසින් මෙම ස්ථානයේ ව්‍යාපාර කටයුතු සිදු නොකර අතහැර තිබුණු අතර 2015 පෙබරවාරි 01 දින වන විට බදුකරුගෙන් අයවිය යුතු රු.3,240,000 ක බදු මුදල අය කරගත නොහැකි වී තිබුණි.

(ix) කළුතර බලවේග ව්‍යාපාරයේ යන්ත්‍ර සූත්‍ර අමතර කොටස් වෙනුවෙන් අයවිය යුතු රු.2,694,443 ක් අයකර ගැනීමට නඩු පවරා තිබුණි. 1992 අප්‍රේල් 22 දින ලබාදුන් තීන්දුව අනුව එම මුදල වාරික 36 කින් ගෙවා අවසන් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් රු.1,991,962 ක් හිඟහිට තිබූ අතර එය අයකර ගැනීමට නීතිපති උපදෙස් විමසා තිබුණි. හිඟ මුදලේ අවසාන වාරිකය 1999 වර්ෂයේ ගෙවා ඇති බැවින් නඩු පැවරීම සඳහා සිවිල් නඩු විධාන සංග්‍රහයේ 337(1) වගන්තිය ප්‍රකාරව අදාළ මුදල් අයකර ගැනීමේ කාලය ඉක්මවා ගොස් ඇති බැවින් ඒ සඳහා නීතිමය ප්‍රතිපාදන නොමැති බව නීතිපතිවරයා දන්වා තිබුණි.

(x) 2010 අගෝස්තු 05 දින මුදල් අමාත්‍යාංශය විසින් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු වාහනයක් දෙපාර්තමේන්තුවේ නමට පවරා ගෙන නොතිබුණු අතර එම රජයේ අළුත්වැඩියා සඳහා 2012 වර්ෂයේ සිට අළුත්වැඩියා සඳහා රු.999,425 ක් වැය කර තිබුණි.

(ආ) 2010 අගෝස්තු 05 දින මුදල් අමාත්‍යාංශය විසින් දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබූ අංක 64 - 3210 දරන වාහනය දෙපාර්තමේන්තුවේ නමට නිත්‍යානුකූලව පවරා ගෙන නොතිබුණු අතර මේ වෙනුවෙන් 2012 වර්ෂයේ සිට අළුත්වැඩියා සඳහා රු.996,425ක් වැය කර තිබුණි.

(ඇ) මාතලේ දිස්ත්‍රික්කයේ පේෂකර්මාන්ත සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරිම සඳහා අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් අත්යන්ත්‍ර 175ක් හා වයිංඩින් යන්ත්‍ර 150ක් මිලදී ගෙන තිබුණ ද ප්‍රාදේශිය ලේකම් කාර්යාල 02ක් සඳහා අත්යන්ත්‍ර හා වයිංඩින් යන්ත්‍ර 50 බැගින් ලබා දීම පමණක් මෙම වැඩසටහන යටතේ සිදු කර තිබුණි.

**3.13 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 04 | 01 | - |
| (ii) | තෘතියික මට්ටම | 01 | - | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 109 | 93 | 16 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 42 | 20 | 22 | - |
| (v) | වෙනත් ( අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 05 | - | 05 |
| | **එකතුව** | **157** | **122** | **40** | **05** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ පේෂ උපදේශිකාවන් තිදෙනෙකු අදාළ තනතුරේ කටයුතුවලින් බැහැර වෙනත් කටයුතු සඳහා ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ සංවර්ධන සහකාරවරයෙකු ලෙස සේවය කරමින් සිටි නිලධාරියෙකු 2011 ජනවාරි 10 දින සිට දෙපාර්තමේන්තුවේ දකුණු පළාත් භාර නිලධාරියෙකු ලෙස ගාල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අනුයුක්ත කර තිබුණි.